අයදුම්කරුවන් සඳහා උපදෙස් (ප්‍රසංග කලා)

**කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය මගින් පවත්වනු ලබන ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවට තෝරාගැනීම සඳහා පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණය - 2024/2025**

1. උක්ත යෝග්‍යතා පරීක්ෂණය හොරණ, වැවල, විල්මට් ඒ පෙරේරා මාවතෙහි පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රී පාලි මණ්ඩප පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා පෙනී සිටින ලෙස මෙයින් දැනුම් දෙමි. (ගමන් මාර්ගය දැක්වෙන සටහන පසුපිටෙහි සඳහන් කර ඇත.)

2. මෙම පරීක්ෂණය **වාචික** සහ **ප්‍රායෝගික** යන කොටස් දෙකකින් සමන්විත වේ. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ තෝරාගැනීම අනුව ප්‍රාසංගික කලාවට අනුබද්ධ විෂයේ කුසලතාවය හා නිපුණතාවය ඇගයීම මෙම පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ.

3. ඔබගේ ඉදිරිපත් කිරීමට සුදුසු අයුරින් සූදානම් වී පැමිණෙන්න.

4. ඔබ විසින් ප්‍රාසංගික කලාවන්ට අදාලව සිදුකර ඇති ක්‍රියාකාරකම් වල ඡායා රූප/ ශ්‍රව්‍ය දෘශ්‍ය කලා නිර්මාණ/ප්‍රාසංගික කලා නිර්මාණ/ තිරරචනා/ පිටපත්/ වැඩ ගොනුව/ නිර්මාණ ගොනු, තිබේ නම් රැගෙන පැමිණිය යුතුය. එසේම ඔබ ලබා ඇති ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සහතික පරීක්ෂණයේදී ඉදිරිපත් කළ හැකිය. (සහතික පත් මුල් පිටපත් නොවන්නේ නම් සත්‍ය පිටපතක් බව සහතික කර රැගෙන ආ යුතුය.)

5. යෝග්‍යතා පරීක්ෂණයට පැමිණීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පත / තැපැල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතුය. එසේ නොමැති නම් මෑතක දී ලබා ගත් ඔබගේ ඡායාරූපයක්, සාමදාන විනිශ්චයකාරවරයෙකු මඟින් එය ඔබේම ඡායාරූපයක් බවට සහතික කරවා ගෙන මෙම ලිපියද සමඟ රැගෙන ආ යුතුය. **මේ කවර අයුරකින් හෝ ස්වකීය අනන්‍යතාවය ඔප්පු කිරීමට අපොහොසත් වන කිසිදු අයදුම්කරුවෙකුට යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.**

6. ප්‍රායෝගික පරීක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන බැවින්, අභියාචනා ඉදිරිපත් කිරීම හෝ පරීක්ෂක මණ්ඩලයට අනිසි බලපෑම් සිදු කිරීමට උත්සාහ දැරීම ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබීමට හේතුවක් වන බව සැලකිය යුතුය.

7. **කවර හෝ හේතුවක් මත මෙම පරීක්ෂණයට එදින නියමිත වේලාවට පෙනී සිටීමට නොහැකි වුවහොත් නැවත මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් නොපැවැත්වෙන බවද මෙයින් අවධාරණය කරනු ලැබේ.**

8. **පරීක්ෂණයට පැමිණීමේදී ප්‍රවේශ පත්‍රයේ (Admission Card) සඳහන් පරිදි තම අත්සන සහතික කරවා ගෙන පැමිණිය යුතුය.**

අංශ ප්‍රධාන
ප්‍රසංග කලා අධ්‍යයනාංශය

CamScanner

# ROAD MAP TO SRI PALEE CAMPUS

